# 10 ශ්‍රේණිය-පුරවැසි අධ්‍යාපනය
# 4 පාඩම
# ආර්ථික ක්‍රම හා ආර්ථික සබඳතා


සැකසුම

A.C.N.කුමාරි

කෑ/දෙහි/නෙවිස්මියර් ඉහළ ම.වි.

# මූලික ආර්ථික ප්‍රශ්න හා ආර්ථික ක්‍රියාකාරකම්

- සමාජ ක්‍රමයක් තුළ මිනිසුන් ජීවත්වීමේ දී විවිධ අවශ්‍යතා ඇති වේ.
- මෙම වුවමනා ඉටුකර ගැනීමට යාමේ දී ඔවුනට විවිධ ප්‍රශ්නවලට මුහුණ දීමට සිදු වේ.
- එම ප්‍රශ්න විවිධාකාරයෙන් විසදා ගනී.

- **අර්ථ ක්‍රමයක් යනු:-**
  - මිනිසාට මුහුණ දීමට සිදුවන මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා යම් සමාජයක් සංවිධානය වී ඇති ආකාරය යි.

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| මිනිසාගේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය මූලික දේවල් වේ.<br>ආහාර, නිවාස, ඇඳුම් පැළඳුම් | අවශ්‍යතා ඉටු කර ගන්නා විවිධ ස්වරූපයන් වේ.<br>නිවාස - පැල්පත්, මැටි ගෙවල්, තට්ටු නිවාස |
| | අසීමිතය |
| | වුවමනා ඉටු කර ගැනීමට අවශ්‍ය තරම් සම්පත් නොමැත. |

- මෙම වුවමනා ඉටුකර ගැනීමට යාමේ දී ඔවුනට විවිධ ප්‍රශ්නවලට මුහුණ දීමට සිදු වේ.
- මෙම ප්‍රශ්න කුමන අර්ථ ක්‍රමයකට වුව ද පොදුය.
- සම්පත් හිඟකම නිසා වුවමනා සපුරා ගැනීමේ දී තේරීමට සිදුවේ.
- **මූලික ආර්ථික ප්‍රශ්න යනු :-**

ඕනෑම අර්ථ ක්‍රමයකට මුහුණ දීමට සිදුවන ප්‍රශ්න වේ.



## මූලික ආර්ථික ප්‍රශ්න

- කුමක්, කොපමණ නිෂ්පාදනය කරන්නේ ද?
- කෙසේ නිෂ්පාදනය කරන්නේද?
- කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේද?

# කෙසේ නිෂ්පාදනය කරන්නේද?

- මෙහි අතුරු ප්‍රශ්න දෙකකි.

I. යොදා ගන්නා ශිල්පීය ක්‍රමය කුමක් ද?
   - ප්‍රාග්ධන සූක්ෂම
   - ශ්‍රම සූක්ෂම

II. නිෂ්පාදනය කරනු ලබන්නේ කුමන අංශයෙන් ද?

# නිෂ්පාදනය

- රාජ්‍ය අංශය
- පෞද්ගලික අංශය
- රාජ්‍ය හා පෞද්ගලික අංශ ඒකාබද්ධව

# නිෂ්පාදන සාධක හා ඒවාට කරන ගෙවීම්

- භාණ්ඩ හා සේවා
  - ආර්ථික භාණ්ඩ
  - ආර්ථික නොවන භාණ්ඩ



4.2 රූපය

භූමිය → බදු



4.3 රූපය

ශ්‍රමය → වැටුප




4.4 රූපය

ප්‍රාග්ධනය → පොළිය



ව්‍යවසායකත්වය → ලාභ



ආර්ථිකයක මූලික ක්‍රියාවලි
නිශ්පාදනය
කෘෂිකාර්මික
කාර්මික
සේවා
බෙදා හැරීම
තොග වෙළදාම
සිල්ලර වෙළදාම
පරිභෝජනය

# නිශ්පාදනය කරන භාණ්ඩ ප්‍රයෝජනයට ගන්නා ආකාරය අනුව බෙදීම

- පාරිභෝගික භාණ්ඩ
- අන්තර් භාණ්ඩ
- ප්‍රාග්ධන භාණ්ඩ

# විවිධ අර්ථ ක්‍රම පිළිබඳ තොරතුරු ගවේෂණය කිරීම

- අර්ථ ක්‍රම ප්‍රධාන කොටස් තුනකට බෙදේ.

1. ධනවාදී අර්ථ ක්‍රමය
2. සමාජවාදී අර්ථ ක්‍රමය
3. මිශ්‍ර අර්ථ ක්‍රමය

# ධනවාදී අර්ථ ක්‍රමය

- දේපළ අයිතිය පෞද්ගලික අංශය සතු ය.
- පෞද්ගලික අංශය ලාභ අපේක්ෂාවෙන් ආර්ථික කටයුතු මෙහෙයව යි.
- ධනවාදී ආර්ථිකයක මූලික ලක්ෂණ
  - ✓ තරඟකාරී වෙළෙඳපොළක් පැවතීම.
  - ✓ නිෂ්පාදන සාධකවල අයිතිය පෞද්ගලික අංශය සතු වීම.
  - ✓ ලාභය අරමුණු කරගෙන නිෂ්පාදනය සිදුවීම.
  - ✓ ආදායම් අසමාන ලෙස බෙදී යාම.
- වෙළෙඳ ප්‍රචාරණය මගින් පාරිභෝගිකයන් තම නිෂ්පාදන වෙත රඳවා ගැනීමට වෙහෙසක් ගන්නා ආකාරය දැකිය හැකිය.
- නමුත් තම අභිමතය පරිදි භාණ්ඩ මිලදී ගැනීමමේ නිදහසක් පාරිභෝගිකයාට ඇත.
- ධනවාදී අර්ථ ක්‍රම පවතින රටවල්.....

ඇමරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය, ජපානය, ඕස්ට්‍රේලියාව

# <u>සමාජවාදී අර්ථ ක්‍රමය</u>

- මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමෙහිලා මධ්‍ය සැලසුම් මණ්ඩලයක් මඟින් ක්‍රියා කරන දේපළ, පොදු අයිතිය යටතේ පවතින ආර්ථික සංවිධාන ක්‍රමයයි.
- මෙම අර්ථ ක්‍රමය <u>සැලසුම් සහගත අර්ථ ක්‍රම, රාජ්‍ය ව්‍යවසාය අර්ථ ක්‍රම</u> ලෙස ද හඳුන්වයි.
- සමාජවාදී ආර්ථිකයක මූලික ලක්ෂණ
  - ✓ දේපළ අයිතිය රජය සතුය.
  - ✓ මධ්‍ය සැලසුම් සණ්ඩලයක් මඟින් ආර්ථිකය මෙහෙයවයි.
  - ✓ මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමේ දී පොදු යහපත උදෙසා කටයුතු කරයි.
- සමාජවාදී අර්ථ ක්‍රම පවතින රටවල්.....

උතුරු කොරියාව, කියුබාව

# මිශ්‍ර අර්ථ ක්‍රමය

- ධනවාදී හා සමාජවාදී අර්ථ ක්‍රම දෙකෙහිම ලක්ෂණ ඇතුළත් වේ.
- මිශ්‍ර ආර්ථිකයක මූලික ලක්ෂණ
  - ✓ නිශ්පාදන සාධකවල අයිතිය රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශය සතු වීම.
  - ✓ මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම සඳහා රජය හා පෞද්ගලික යන දෙඅංශයම ක්‍රියා කිරීම.
  - ✓ වෙළෙඳපොළ මත භාණ්ඩවල මිල තීරණය වුව ද රජය ඒ සඳහා මැදිහත් වීම.
  - ✓ පෞද්ගලික හා රාජ්‍ය ව්‍යවසාය යන අංශ දෙකම දක්නට ලැබීම.
  - ✓ පොදු යහපත සඳහා සුබසාධන කටයුතු කිරීමට රජය මැදිහත් වීම.
- මිශ්‍ර අර්ථ ක්‍රම පවතින රටවල්.....

ශ්‍රී ලංකාව, ලෝකයේ බොහෝ රටවල දක්නට ලැබේ....

# වෙළෙඳපොළ ආර්ථික සංකල්පය

- වෙළෙඳපොළ ආර්ථික සංකල්පය ලෙස වර්ථමානයේ ක්‍රියාත්මක වන්නේ නව - ලිබරල්වාදී ආර්ථික ක්‍රමයයි.
- නව - ලිබරල්වාදී ආර්ථික ක්‍රමයේ මූලික ලක්ෂණ

  - ✓ රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම.
  - ✓ වෙළෙඳපොළ තත්ත්ව මත මිල තීරණය වීමට ඉඩ සැලසීම.
  - ✓ දේශීය හා විදේශීය පෞද්ගලික ආයෝජකයන් දිරි ගැන්වීම.
  - ✓ සහනාධාර හා මිල පාලන ක්‍රම ලිහිල් කිරීම.
  - ✓ පෞද්ගලික දේපළ අයිතියට ඉඩ දීම.
  - ✓ ආර්ථික කටයුතුවලට රාජ්‍ය අංශයේ මැදිහත් වීම සීමා වීම.
  - ✓ වෙළෙඳපොළ බාධා, ආනයන අපනයන බදු ආදිය ඉවත් කිරීම.
  - ✓ පාලන නීති රීති, සීමා අවම කිරීම.
  - ✓ විනිමය අනුපාතික පාලනයකින් තොරව විදහසේ තීරණය වීමට ඉඩ සැලසීම.

# වෙළෙඳපොළ ආර්ථිකයන්හි විවිධ ස්වරූප

1) ධනවාදී වෙළෙඳපොළ ලක්ෂණ වැඩි වශයෙන් දක්නට ලැබෙන වෙළෙඳපොළ

උදා:- ඇමරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, සිංගප්පූරුව, දකුණු කොරියාව

2) සමාජවාදී වෙළෙඳපොළ ලක්ෂණ වැඩි වශයෙන් දක්නට ලැබෙන වෙළෙඳපොළ

උදා:- උතුරු කොරියාව, කියුබාව

3) පරිවර්තන ආර්ථික හෙවත් වෙළෙඳපොළ ආර්ථික ක්‍රම කරා ගමන් කරමින් සිටින අර්ථ ක්‍රමවල ඇති වෙළෙඳපොළ

උදා:- ආමේනියාව, අසබයිජාන්, බෙලාරස්, එස්ටෝනියාව, ජෝර්ජියාව, කසකස්තානය, ලැට්වියාව, ලිතුවේනියාව, රුසියාව, යුක්රේනය, උස්බෙකිස්තානය වැනි සෝවියට් සමූහාණ්ඩුවට අයත් ව තිබූ රටවල්

## පරිවර්තන ආර්ථිකයන්හි ලක්ෂණ

- පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලිකරණය කිරීම
- පෞද්ගලික දේපළ අයිතියට ඉඩ සලසා දීම
- පෞද්ගලික ව්‍යවසායන් දිරි ගැන්වීම
- ආර්ථිකය ලිහිල්කරණය

# ශ්‍රී ලංකාව කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම

- ශ්‍රී ලංකාව දීර්ඝ ඉතිහාසයක් ඇති රටකි.
- 1948 දී ඉංග්‍රීසි පාලනයෙන් නිදහස ලබා ගැනීමෙන් පසු සමාජවාදී, ධනවාදී මෙන් ම මිශ්‍ර ආර්ථික ලක්ෂණ සහිත අර්ථ ක්‍රමයක් ක්‍රියාත්මක වූ දක්නට ලැබේ.

# ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික ක්‍රමය හා සංවර්ධනය

- ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ 1977 න් පසු විවෘත ආර්ථික ප්‍රතිපත්තිය මත ක්‍රියාත්මක වන වෙළෙඳපොළ හිතකර අර්ථ ක්‍රමයක් වේ.
- 1977න් පසු විවෘත ආර්ථික ප්‍රතිපත්තිය යටතේ පෞද්ගලික ව්‍යවසායන් දිරිගැන්වීම සඳහා විවිධ ක්‍රියාමාර් අර්ථ ක්‍රමයට හඳුන්වා දෙනු ලැබීය.
  - ✓ පෞද්ගලික ආයෝජකයන්ට විවිධ බදු සහන ලබා දීම.
  - ✓ වෙළෙඳ බාධා (තීරු බදු) අඩු කිරීම.
  - ✓ වෙළෙඳපොළට රජයේ මැදිහත් වීම අඩු කිරීම.
  - ✓ විදේශ ආයෝජන දිරි ගැන්වීම.
  - ✓ රාජ්‍ය දේපළ පෞද්ගලීකරණය කිරීම.
  - ✓ විනිමය අනුපාතිකය නිදහසේ තීරණ ගැනීමට ඉඩ හැරීම.
  - ✓ ආනයන අපනයන ආර්ථිකයක් හඳුන්වා දීම.
  - ✓ රාජ්‍ය ආයතන ද තරගකාරී වෙළෙඳපොළට විවෘත කිරීම.
  - ✓ යටිතල පහසුකම් පුළුල් කිරීම.
  - ✓ නිදහස් වෙළෙඳ කලාප පිහිටුවීම.

## ශ්‍රී ලංකාවේ දක්නට ඇති වෙළෙඳපොළ අර්ථ ක්‍රමයක ලක්ෂණ

- පෞද්ගලික අංශය දිරි ගැන්වීම.
- රජය ව්‍යවසාය කටයුතුවලින් ඈත්වීම.
- රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලිකරණය කිරීම.
- විදේශ වෙළෙඳාම සම්බන්ධ බාධා ලිහිල් කිරීම.
- රජය විනිමය පාලනයෙන් ඉවත් වීම.
- රජය ව්‍යවසායකයන් දිරි ගන්වන්නකු ලෙස ක්‍රියා කිරීම
- රුපියලේ විදේශ අගය වෙළෙඳපොළේ තීරණය වීමට ඉඩ හැරීම.


# සංවර්ධනය හැඳින්වීම

"ආර්ථික, දේශපාලන, සමාජ හා මානව යන අංශයන්ගෙන් දියුණුවීම හා දරිද්‍රතාව අවම වීමත් සමග තිරසර දියුණුව ඇති කිරීම සංවර්ධනයයි. "

(එක්සත් ජාතීන්ගේ සංවර්ධන වාර්තාව, 2000)

"සංකීර්ණ සංස්කෘතික හා පාරිසරික සාධක ඒවායේ අන්තර් ක්‍රියාකාරීත්වය මත ඇතිවන ආර්ථික හා සමාජීය පරිණාමන ක්‍රියාවලිය සංවර්ධනයයි."

(www.business dictionary.com. 2013.08.12)


සංවර්ධනය
ආර්ථික සංවර්ධනය
පුද්ගල සංවර්ධනය
සංස්කෘතික සංවර්ධනය
සමාජ සංවර්ධනය
සදාචාර සංවර්ධනය
තිරසාර සංවර්ධනය

# තිරසාර සංවර්ධනය හැඳින්වීම

- මෑත කාලයේ වැඩිපුර සාකච්ඡාවට බඳුන් වී ඇති සංකල්පයකි.
- සංවර්ධනය කරා යන ගමනේ දී ආර්ථිකය සතු සම්පත් අනාගත පරම්පරාව සඳහා සුරක්ෂිත කරමින් වර්තමාන අවශ්‍යතා ඉටු කර ගැනීම තිරසාර සංවර්ධනය යි.
- මෙය ධරණීය සංවර්ධනය ලෙස ද හඳුන්වයි.
- තිරසාර සංවර්ධනයේ දී සැලකිය යුතු මූලික ප්‍රතිපත්ති කිහිපයක් සැච්ස් (Sachs,2004) ද සඳහන් කර ඇත.

තිරසාර සංවර්ධනයේ දී සැලකිය යුතු කරුණු

- මූලික අවශ්‍යතා තෘප්තිමත් කර ගැනීම.
- අනාගත පරම්පරාවත් සමග ඒකමතික වීම.
- ජනතා සහභාගීත්වය ඇති කර ගැනීම.
- ස්වභාවික සම්පත් සංරක්ෂණය.
- පරිසරය ආරක්ෂා කර ගැනීම.
- සමාජ සුරක්ෂිතභාවය.
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම.

❖ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානය 2000 දී පැවැත් වූ සහස්‍රක සමුළුවේ දී සම්මත කර ගත් **<u>සහස්‍රක ඉලක්ක 8</u>**.....

1) දුප්පත්කම හා සාගින්න තුරන් කිරීම.
2) පොදු ප්‍රාථමික අධ්‍යාපනයක් ළඟා කර ගැනීම.
3) ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව හා කාන්තාව බලවන්ත කිරීම.
4) ළදරු මරණ අනුපාතිකය අඩු කිරීම.
5) මානසික සෞඛ්‍ය වර්ධනය.
6) ඒඩ්ස්, මැලේරියා වැනි රෝග මර්ධනය කිරීම.
7) පාරිසරික තිරසර බව සුරක්ෂිත කිරීම.
8) සංවර්ධනය සඳහා ගෝලීය සම්බන්ධතාවක් ඇති කිරීම.

# වර්තමාන ශ්‍රී ලංකා ආර්ථිකයේ නව සංවර්ධන ප්‍රවණතා

- ශ්‍රී ලංකාවේ නව ප්‍රවණතා, නිදහසින් පසු ඇති වූ වෙනස්කම් ප්‍රධාන අවධි කිහිපයකට බෙදා දැක්විය හැකි ය.

1) 1948 – 1960
2) 1961 – 1970
3) 1970 – 1977
4) 1978 – 1993
5) 1994 – 2004



6) 2004 වර්ෂයෙන් පසුව ද විවෘත ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක විය.එසේ වුව ද දේශීය කෘෂි අංශය හා ආයෝජන කෙරෙහි අවධානය යොමු වීමක් ද තිබේ.

- දැනට සිදුවෙමින් පවතින සංවර්ධන ක්‍රියා නිසා ශ්‍රී ලංකාවට අත්වන වාසි කිහිපයකි....
  - සේවා නියුක්තිය ඉහළ යාම.
  - විදේශ විනිමය ඉපයුම් ඉහළ යාම.
  - ජනතාවගේ ජීවන මට්ටම උසස් වීම.
  - ප්‍රාදේශීය සංවර්ධනය වේගවත් වීම.
  - ඉහළ ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීම.
  - ලෝක අර්බුදවලට මුහුණ දීමට හැකි වීම.
  - යටිතල පහසුකම් වර්ධනය වීම.
  - නව රැකියා වෙළෙඳපොළ පුළුල් වීම.
  - ජාත්‍යන්තරය තුළ කැපී පෙනෙන තත්ත්වයක් ලබා ගැනීම.
  - සාමය පවත්වා ගැනීමට හැකි වීම.

# ශ්‍රී ලංකාවේ සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාව ක්‍රමයෙන් අඩුවීම

| වර්ෂය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|---|---|
| පවුල් සංඛ්‍යාව | 1960664 | 1916594 | 1844660 | 1631133 | 1600786 | 1572129 | 1541619 | 1515613 |

# ශ්‍රී ලංකාවේ සංවර්ධන පිළිබඳ දර්ශක කිහිපයක්

| දර්ශකය | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|
| ළදරු මරණ අනුපාතිකය | 10.0 | 8.5 | 8.5 | 9.4 |
| උපත් අනුපාතිකය | 18.4 | 17.6 | 17.6 | 17.4 |
| සාක්ෂරතාව | 91.3 | 91.4 | 91.9 | 92.2 |
| ප්‍රාථමික අධ්‍යාපනයට ඇතුළත්වීමේ ප්‍රතිශතය | 102 | 91 | 97 | 92 |
| මානව සංවර්ධන දර්ශකයට අනුව ශ්‍රී ලංකාවට හිමි තැන | 102 | 91 | 97 | 92 |

# තාක්ෂණික දියුණුව හා ගෝලීයකරණය ලෝක ආර්ථිකය හා ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි ඇති කරන බලපෑම

- **තාක්ෂණික දියුණුව හා ගෝලීයකරණය**

යුරෝපයේ ඇති වූ නව කාර්මික පුනරුදයත් සමග නව තාක්ෂණය ද ක්‍රමයෙන් දියුණු විය.

අද වන විට මෙම විද්‍යාත්මක හා තාක්ෂණය පදනම් කරගෙන ලෝකයේ සෑම අංශයක් ම එකට සම්බන්ධ වී තිබේ.

එය **විශ්ව ගම්මානය** හෙවත් ගෝලීයකරණය ලෙසින් ද හඳුන්වනු ලැබේ.

## ➢ ගෝලීයකරණය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ කිහිපයක්

- ✓ වැඩ ලෝකය පුළුල් වීම.
- ✓ ගෝලීය වෙළෙඳපොළ පුළුල් වීම.
- ✓ ලෝකයේ ඕනෑම රටක ජීවත්වීමට හැකිවීම.
- ✓ තම දක්ෂතා හා හැකියා අනුව වෙනත් රටක සේවය කිරීමට හැකි වීම.
- ✓ අඩු මිලට ශ්‍රමය ලබා ගත හැකි රටවලට කර්මාන්ත සංක්‍රමණය වීම.

තවද......

- ✓ ලෝක බලවතුන් ලෝක වෙළෙඳපොළ තුළ තම ආධිපත්‍ය පවත්වා ගැනීමට කටයුතු කරයි.
- ✓ ලෝක බලවතුන් සංවර්ධනය වන රටවල් සඳහා නව යටත් විජිතවාදය පැතිරවීම සිදු කිරීමට උත්සහ දරයි.

# ගෝලීයකරණය ලෝක ආර්ථිකයට කරන බලපෑම

- ලෝකයම එකම භාෂාවක් කථා කරන එකම මුදල් ඒකකයක් භාවිත කරන තනි ජාතියක් බවට පත් විය යුතු බව **යුරෝපා සංගමයේ** අදහසයි.
- ලෝකයම තනි ඒකකයක් බවට පත් කිරීම සඳහා ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, එක්සත් ජාතීන්ගේ සංවිධානය, ආසියානු සංවර්ධන බැංකුව, ලෝක වෙළෙඳ සංවිධානය වැනි ආයතන ද උත්සහ දරයි.
- එම ආයතන තුළින් සෘජුව හා වක්‍රව බලපෑම් කරනු ලබයි.

## ගෝලීයකරණය නිසා ලෝක ආර්ථිකය තුළ දක්නට ලැබෙන ලක්ෂණ

- බහු ජාතික සමාගම් බිහි වීම.
- විවිධ රටවල පවතින බදු සහන, අඩු මිල ශ්‍රමය, ලිහිල් පාරිසරික නීති වැනි සාධක පදනම් කර ගෙන ආයෝජනය කිරීම.
- විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ලෝකයට හඳුන්වා දීම.
- විවිධ කලාපීය සහයෝගිතා සංවිධාන බිහිවීම.
- දේශීය මුදල් විදේශවලට ඇදී යාම.
- ලෝකයේ බලවත් රටවල් තම දේශපාලන බලය අනෙකුත් රටවලට ව්‍යාප්ත කිරීම.
- තොරතුරු තාක්ෂණයේ විප්ලවීය වෙනසක් සිදුවීම.
- වෙළඳාමට තිබූ බාධා ඉවත් කරමින් නිර්බාධ වෙළඳාම ඇතිවීම.
- ශ්‍රම හා ප්‍රාග්ධන සචලතා
- ලෝක නිශ්පාදන මත ආර්ථික කටයුතු සිදුවීම.

# ගෝලීයකරණයට මුහුණ දීමට බිහි වී ඇති සංවිධාන.....

- යුරෝපා සංගමය(EU)
- උතුරු ඇමරිකානු නිදහස් ගිවිසුම(NAFTA)
- දකුණු ආසියානු වරණාත්මක වෙළෙඳ ගිවිසුම(SAPTA)
- බෙංගාල මුහුදු තීරය අවට රටවල් පිහිටුවා ගත් ආර්ථික සහයෝගීතා සංගමය(BIMST-EC)

**ලෝක ආර්ථික කණ්ඩායම් ද බිහි වී ඇත.**

- G7
- G77
- G24
- G15

# ගෝලීයකරණය ශ්‍රී ලංකාවට කරන බලපෑම්



4.12 රූපය - නවීන සන්නිවේදන උපකරණ කිහිපයක්

# ධනාත්මක බලපෑම්

1) විදේශ ආයෝජන හා නවීන තාක්ෂණය ගලා ඒම.
2) වැඩ ලෝකය තුළ නව රැකියා අවස්ථා නිර්මාණය වීම නිසා සේවා වියුක්තිය අඩු වීම.
3) දේශීය නිෂ්පාදන සාධකවලට වැඩි ඉල්ලුමක් ඇතිවීම.
4) කාර්මික හා සේවා අංශවල ප්‍රගතියක් ඇතිවීම.
5) ජාත්‍යන්තර වෙළෙඳපොළ පදනම් කරගත් දේශීය නිෂ්පාදන බිහි වීම.
6) ගෙවුම් ශේෂ තත්ත්වය යහපත් වීම.
7) ආර්ථික විවිධාංගීකරණය වීම.
8) ගුණාත්මක බවින් යුත් නිෂ්පාදන බිහිවීම.
9) විදේශීය විශේෂඥ දැනුම මෙරටට ගලා ඒම නිසා දේශීය මානව සම්පත දියුණු වීම.
10) නිෂ්පාදන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් පුළුල් වීම.
11) දේශීය සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබාගත හැකි වීම.
12) මහා පරිමාණ කර්මාන්ත නගරයෙන් බැහැරව ස්ථාන ගත වීම නිසා ප්‍රාදේශීය සංවර්ධනයක් සිදුවීම.
13) විවිධ කලාපීය සංවිධාන හා එකතුවීමට හැකිවීම.
14) අකාර්යක්ෂම කර්මාන්ත වෙළෙඳපොළෙන් ඉවත් වීම.
15) දේශීය පාරිභෝගිකයාට ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු භාණ්ඩ ලබා ගැනීමට ඉඩ සැලසීම.

## ඍණාත්මක බලපෑම්

1) බහු ජාතික නිෂ්පාදන සමඟ දේශීය නිශ්පාදකයන්ට තරඟ කිරිමට නොහැකි වීම.
2) කාර්මික ආයනවලින් සිදුවන පාරිසරික හානිය ඉහළ යාම
3) විදේශ විනිමය ලාභාංශ, පොලී හා ණය වාරික ලෙසින් විදේශවලට ඇදී යාම.
4) බුද්ධි ගලනය වේගවත් වීම.
5) සංවර්ධිත රටවලින් සිදුවන බලපෑම් ඉහළ යාම.
6) දේශීය සංස්කෘතියට විවිධ බලපෑම් එල්ල වීම.
7) නොගැලපෙන ආර්ථික හා පාරිභෝජන රටා රට තුළ ප්‍රචලිත වීම.
8) විදේශ ණය හා ආධාර මත යැපීමට සිදු වීම.
9) රාජ්‍ය අංශය ආර්ථික කටයුතුවලින් ඈත්වීම නිසා මහජන සුබසාධනය සම්බන්ධ ගැටලු මතු වීම.
10) විදේශ ණය ලබා ගැනීමේ දී කොන්දේසිවලට යටත්වීමට සිදුවීම.
11) මිල පාලනය වැනි ආරක්ෂණවාදී උපක්‍රමවලින් ඈත්වීම නිසා දිළිඳු ජනතාව පීඩාවට පත්වීම.
12) දේශීය සම්පත් සූරා කෑමට ලක්වීම.
13) දේශීය යැපුම් ආර්ථික රටාව විනාශ වීම.
14) දේශීය ළදරු කර්මාන්ත විනාශ වී යාම.
15) ලෝක ආර්ථිකයේ වෙනස්කම්වලට ඍජුවම මුහුණ දීම.

# පැවරුම්

**2019 අ.පො.ස.(සා.පෙළ) පුරවැසි අධ්‍යාපනය II ප්‍රශ්න පත්‍රයෙන් උපුටා ගන්නා ලදී.**

I. සමාජ ක්‍රම පොදුවේ මුහුණ දෙන මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීමට විවිධ ක්‍රියා මාර්ග අනුගමනය කරනු ලැබේ.

II. ලෝකයේ දක්නට ලැබෙන අර්ථ ක්‍රම දෙකක් නම් කරන්න.

III. අර්ථක්‍රම පොදුවේ මුහුණ දෙන ආර්ථික ප්‍රශ්න තුන සඳහන් කරන්න.

IV. ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළ අර්ථ ක්‍රමය තුළ දක්නට ලබෙන ලක්ෂණ තුනක් නම් කරන්න.

V. ඉන් එක් ලක්ෂණයක් කෙටියෙන් විස්තර කරන්න.

**2018 අ.පො.ස.(සා.පෙළ) පුරවැසි අධ්‍යාපනය II ප්‍රශ්න පත්‍රයෙන් උපුටා ගන්නා ලදී.**

ආර්ථිකයක සිදුවන ක්‍රියාවලි අතර නිෂ්පාදන ක්‍රියාවලිය වැදගත් වේ.

I. නිෂ්පාදන සාධක දෙකක් නම් කරන්න.

II. ආර්ථිකයක නිෂ්පාදන ක්‍රියාවලිය සිදුවන ප්‍රධාන අංශ තුන සඳහන් කරන්න.

III. නිශ්පාදිත භාණ්ඩ පරිභෝජනය කෙරෙන ආකාර අනුව බෙදිය හැකි කොටස් තුන නම් කර, ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

**2017 අ.පො.ස.(සා.පෙළ) පුරවැසි අධ්‍යාපනය II ප්‍රශ්න පත්‍රයෙන් උපුටා ගන්නා ලදී.**

I. මිනිසාගේ පැවැත්ම සඳහා වූ මූලික අවශ්‍යතා දෙකක් සඳහන් කරන්න.

II. ඕනෑම අර්ථ ක්‍රමයකට මුහුණ පෑමට සිදුවන මූලික ආර්ථික ප්‍රශ්න තුන සඳහන් කරන්න.

III. වෙළෙඳපොළ අර්ථ ක්‍රමවල දක්නට ඇති විවිධ ස්වරූප දෙකක් සඳහන් කරන්න.

IV. ශ්‍රී ලංකාවේ දක්නට ඇති වෙළෙඳපොළ අර්ථක්‍රමයේ ලක්ෂණ තුනක් කෙටියෙන් විස්තර කරන්න.